**හැඳින්වීම :**

මානව විද්‍යාව, ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව මගින් මිනිස් සංහතියේ සම්භවය,විවිධත්වය ඇතුළුව සමාජ, සංස්කෘතික, දේශපාලන සහ ආර්ථික වැනි විෂය කරුණු පදනම් කරගෙන සාම්ප්‍රදායික සමාජ පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් ලබා දීමට අපේක්ෂාකෙරේ. මෙබඳු සාම්ප්‍රදායික ජීවන රටාවක් ඇති සමාජ සඳහා නූතන සංවර්ධන යෝජනා ක්‍රම මගින් සිදුවන බලපෑම් නිසා ඒවා ඉතා වේගයෙන් විනාශ වී යාම හෝ අතුරුදහන් වීම සිදුවන බැවින් එබඳු සමාජ පිළිබඳ තොරතුරු වාර්තාගත කිරීම හා කළමනාකරණය කිරීම මගින් පැරණි මානව උරුමය අවබෝධ කරගැනීම වැදගත් වේ.

පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ සංස්කෘතික මානව විද්‍යාව සහ මානවවංශ පුරාවිද්‍යාව පිළිබඳව ශාස්ත්‍රවේදී විශේෂ දෙවන වසර පාඨමාලාවක් ද මානවවංශ පුරාවිද්‍යාව පිළිබඳ වරණීය පාඨමාලාවක් ද වශයෙන් මෙම විෂයය දැනට උගන්වනු ලැබේ. කාලීන අවශ්‍යතාව සලකා, මානව විද්‍යාව ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව ස්වාධීන විෂයයක් ලෙස හඳුන්වාදීමට අදහස් කෙරේ.

| | |
|---|---|
| **වර්ගය :** | ප්‍රධාන විෂයය |
| **ඒකක සංකේතය :** | ANTH E1015 |
| **විෂය ඒකකය :** | මානව විද්‍යාව පිළිබඳ හැඳින්වීම |
| **ඉගෙනුම් ඵල:** | මෙම ඒකකය අවසානයේ දී විද්‍යාර්ථීන්ට මානව විද්‍යාවේ ප්‍රභේද, සංකල්ප සහ ආකෘති පිළිබඳ දැනුම සහ අවබෝධය ප්‍රකාශ කිරීමට හැකි වනු ඇත. |
| **ඒකක අන්තර්ගතය :** | මානව විද්‍යාව පිළිබඳ හැඳින්වීමක්, මානව සංස්කෘතිය පිළිබඳ විමසීමක්, ද්‍රව්‍යමය සංස්කෘතියේ ඉතිහාසය, සංස්කෘතික මානව විද්‍යාව සහ භෞතික මානව විද්‍යාව පිළිබඳ අධ්‍යයනය, මානව විද්‍යාවේ මූලික සංකල්ප, මානව විද්‍යා කෞතුකාගාර සංවිධානය, පුරාණ ආහාර භාවිතය, ගෝත්‍රික ජනයාගේ චර්යා රටා, ශ්‍රීලංකා සමාජය හා ආගමික ආයතන, පැරණි ක්‍රීඩා, දෘශ්‍ය මාධ්‍ය හා මානව විද්‍යාව ආදි ය. |
| **ඉගැන්වීම් ක්‍රම :** | දේශන, පැවරුම්, සාකච්ඡා, ක්ෂේත්‍ර අධ්‍යයන |
| **ඇගයීම් පටිපාටිය ඃ** | පාඨමාලාව අවසානයේ ලිඛිත පරීක්ෂණය, පැවරුම්, නිබන්ධන, දෘශ්‍ය මාධ්‍ය මගින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම් |

**නිර්දේශිත කියවීම් :**


Carrithers, Michael. (1983).*Forest Monks of Sri Lanka: an anthropological and historical study*.USA: Oxford University Press.

Ember, Carol R. Melvin Ember & Peter N. Peregrine (2001). *Anthropology* (Tenth Edition), New Delhi:Pearson Education Asia.

Hodder, Ian. (1982). *The present past: an introduction to anthropology for archaeologists*.London: B.T. Batsford.

Kottak, Conrad Phillip. (2002). *Cultural Anthropology* ($9^{th}$ Ed.). Boston: McGraw Hill.

Yalman, Nur. (1971). *Under the Bo Tree*, University of California Press, Berkeley.